# අධ්‍යාපන අමාත්‍යංශය ,තාක්ෂණ ශාඛාව

# 28 ගෘහ ආර්ථික විද්‍යාව

## 2023 අ.පො.ස (උසස් පෙළ) – ආදර්ශ පෙරහුරු ප්‍රශ්න පත්‍රය.

කාලය පැය 2 යි

## I කොටස

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) , (2) , (3) , (4) , (5) යන පිළිතුරු වලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන,එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් ( × ) යොදා දක්වන්න.**

01. ප්‍රාථමික වර්ණ දෙකක් එක සමාන ප්‍රමාණවලින් මිශ්‍ර කිරීමෙන් සෑදෙන වර්ණයකි,

1. නිල් 2. රතු 3. දම් 4. නිල් දම් 5. නිල්කොළ

02. නිවසක් ගොඩනැගීමේදී ඉංජිනේරු ගඩොල් බිත්තියක් යෙදීමට වඩාත් සුදුසු දිශාව වන්නේ නිවසේ,

1. උතුරු දිශාවට ය. 2. නැගෙනහිර දිශාවට ය. 3. දකුණු දිශාවට ය.
4. ගිනිකොණ දිශාවට ය. 5. වයඹ දිශාවට ය.

03. ගොඩනැගිල්ලක බාහිර අවකාශ නිර්මාණයේදී සලකා බැලිය යුතු සාධකයක් **නොවන්නේ,**

1. හැඩතල නිර්මාණය 2. භූ දර්ශනය 3. පරිසරය
4. උපාංග 5. ප්‍රමිතිය

04. නිර්මාණකරණයේදී භාවිත කරන මූලධර්මයක් හා මූලිකාංගයක් අනුපිළිවෙළින් දැක්වෙනුයේ ,

1. වයනය සහ රිද්මය . 2. හැඩය සහ වයනය . 3. වර්ණය හා අවධාරණය .
4. රිද්මය හා වයනය . 5. වර්ණය සහ හැඩය .

05. ඔමේගා - 6 අඩංගු බහු අසංතෘප්ත මේද අම්ලයකි,

1. ස්ටියරික් අම්ල ය. 2. ඇල්ෆා ලිනෝලෙනික් අම්ල ය. 3. ලිනොලෙයික් අම්ල ය.
4. ඔලෙයික් අම්ල ය. 5. පාමටික් අම්ල ය.

06. කාබෝහයිඩ්‍රේට පිළිබඳ **නිවරැදි** ප්‍රකාශය තෝරන්න.

1. තැනුම් ඒකක දෙකකින් සමන්විත කාබෝහයිඩ්‍රේට මොනොසැකරයිඩ වේ.
2. මොනොසැකරයිඩ ශක්තිය ලෙස අක්මාවෙහි පමණක් සංචිත වේ.
3. හරිත ශාකවල ගබඩා කර ඇති පිෂ්ඨය ඇමයිලෝස් හා ඇමයිලෝ පෙක්ටින් යන ද්‍රව්‍යවලින් සැකසී ඇත.
4. කාබෝහයිඩ්‍රේට අණුවක O හා H අතර අනුපාතය 2 : 1 කි.
5. සෙලියුලෝස් යනු ප්‍රභාසංස්ලේෂණයේ ඵලයකි.

07. සත්ත්ව ආහාරවල **පමණක්** අඩංගු B කාණ්ඩයේ විටමින වර්ගයක් වනුයේ,

1. පිරිඩොක්සීන් ය. 2. සයනොකොබැලමින් ය 3. බයොටීන් ය 4. ග්ලූටමික් අම්ල ය. 5. ෆෝලික් අම්ල ය.

08. විටමිනයක් පිළිබඳ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A - අවශෝෂණය කර ගැනීම සඳහා ද්‍රාවකයක් ලෙස මේදය අවශ්‍ය වේ.

B - විටමිනය ප්‍රතිඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරයි.

C - ඇස්වල හා සමේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වේ.

D - අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් භාවිතයට ගැනීම හානිකරයි.

මෙම විටමිනය විය හැක්කේ,

1. විටමින් A ය. 2. විටමින් C ය. 3. විටමින් D ය. 4. විටමින් E ය. 5. විටමින් K ය.

09. එකම ආහාර වේලක බත් හා මුං ඇට ව්‍යංජනයක් තිබීමෙන් පරිපූර්ණය වන අත්‍යාවශ්‍ය ඇමයිනෝ අම්ල දෙකකි,

1. ලයිසීන් හා ග්ලයිසීන් ය . 2. හිස්ටිඩීන් හා වැලීන් ය . 3. ආජිනීන් හා ඇලනීන් ය .

4. මෙතියොනීන් හා ලයිසීන් ය . 5. තයිරොක්සීන් හා ට්‍රිප්ටොෆෑන් ය .

10 . දිවා ආහාර වේලක් තුළ ගුණාත්මක ලෙස ධාන්‍ය ඇතුළත් කර ගැනීමේ වැදගත්කම දැක්වෙන, වඩාත් **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

1. ආහාර වේලට වැඩි ප්‍රමාණයක් පිරිපහදු කරන ලද පිටි වර්ග හා ධාන්‍ය ඇතුළත් කර ගැනීමෙන් ශක්තිය ලබා ගත හැකි ය.

2. තම්බන ලද නිවුඩ්ඩ සහිත සහල් භාවිතයෙන් , ශක්තිය අවශ්‍යතා වෙන් 50% - 65% ක් හා ක්ෂුද්‍ර පෝෂක ලබාගත හැකි ය.

3. ධාන්‍යමය බීජ තුළ පිෂ්ඨය හා ප්‍රෝටීන අඩංගු වන බැවින් ප්‍රධාන ආහාර සඳහා භාවිතා කළ හැකි ය.

4. සහල් වඩාත් පෑහීම නිසා ආහාර සැකසීමට යෝග්‍ය වන අතර වැඩි පෝෂණයක් ලබා දෙයි.

5. පෝෂණයට අමතරව ධාන්‍ය පිෂ්ඨය මගින් මළබද්ධය වැළැක්වීම, ස්ථූල බව හා දියවැඩියාව පාලනය කිරීම සිදුකළ හැකි ය.

11 . විටමින් A , විටමින් $B_{12}$ සහ ,විටමින් E හි රසායනික නාම **අනුපිළිවෙළින්** දැක්වෙන වරණය තෝරන්න.

1. බීටා කැරොටින්, සයනොකොබැලමින් සහ කැල්සිෆෙරෝල් ය.

2. බීටා කැරොටින්, කැල්සිෆෙරෝල් සහ සයනොකොබැලමින් ය.

3. ටොකෝෆෙරෝල්, රෙටිනෝල් සහ සයනොකොබැලමින් ය.

4. රෙටිනෝල්, සයනොකොබැලමින් සහ ටොකෝෆෙරෝල් ය.

5. රෙටිනෝල්, බීටා කැරොටින් සහ ටොකෝෆෙරෝල් ය.

12. මිනිසාගේ ජීර්ණ පද්ධතියේ ව්‍යුහය පිළිබඳ **නිරවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

1. ශේෂාන්ත්‍රය, මහාන්ත්‍රයට සම්බන්ධ වන ස්ථානය ශූන්‍යාන්ත්‍රය පිහිටා ඇත.

2. යාකෘතික අග්න්‍යාශික ප්‍රණාලය ග්‍රහණියේ මධ්‍ය ප්‍රදේශයට විවෘත වේ.

3. ක්ෂුද්‍රාන්තය, ශේෂාන්ත්‍රය හා මහාන්ත්‍රය යන කොටස්වලින් යුක්ත වේ.

4. අන්නස්‍රෝතය ආමාශයට විවෘත වන ස්ථානයෙහි ආලාර වක්‍ර පිධානය පිහිටයි.

5. මහාන්ත්‍රය ක්ෂුද්‍රාන්තයට වඩා දිගු වන අතර මහාන්ත්‍රයේ බිත්තිවල පේශි ඝනත්වය වැඩිය.

13. මිනිසාගේ ග්‍රහණියේදී ආමලසය සමග එකතු වන, එන්සයිම ඇතුළත් වරණය වන්නේ,

1. පෙප්සින්, ට්‍රිප්සින් සහ රෙනින් ය. 2. ඇමයිලේස්, ලයිපේස්, සහ සුක්රේස් ය.

3. ලයිපේස්, ලැක්ටේස් සහ පෙප්ටයිඩේස් ය. 4. ඇමයිලේස් ,ට්‍රිප්සින් සහ ලයිපේස් ය.

5. පෙප්ටයිඩේස් , ලයිපේස් සහ මෝල්ටේස් ය.

14. දරුවෙකු තුළින් පහත සඳහන් ලක්ෂණ පෙන්නුම් කරන ලදී.

X - උසට සරිලන බර අඩුය. Y - ශරීරය කෙසග වන අතර මාංශපේශි ක්ෂය වී ඇත.
Z - අස්ථිවල හැඩය පහසුවෙන් පෙනේ.

මෙම ඌනතා ලක්ෂණ පෙන්නුම් කරන රෝගී තත්ත්වය වනුයේ,

1. කාලීන මන්දපෝෂණය යි. 2. තීව්‍ර මන්ද පෝෂණය යි.
3. මධ්‍යස්ථ තීව්‍ර මන්දපෝෂණය යි. 4. ක්වොෂියෝකෝර් තත්ත්වය යි.
5. ප්‍රෝටීන්- ශක්ති මන්ද පෝෂණය යි.

15. ළදරුවිය සඳහා ආහාර වේල් සැලසුම් කිරීම පිළිබඳව **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

1. ආහාර වේල තුළ සත්ත්ව ආහාර, මාෂ භෝග හා වෙනත් බීජ වර්ග ඇතුළත් කළ හැකි ය.
2. විටමින් A බහුල සත්ත්වමය ආහාර මෙන්ම කහ පැහැති එළවළු, පලතුරු හා පළාවර්ග ද එකතු කළ හැකි ය.
3. ප්‍රමාණවත් ලෙස රුචිය වර්ධනය සඳහා ලුණු, සීනි හා පැණි එකතු කළ ආහාර ලබාදිය හැකි ය.
4. ආහාර වේල් මගින් අනුපූරක ආහාර හඳුන්වා දිය හැකි ය.
5. වයස අවුරුද්දක් වන විට පවුලේ ආහාර හඳුන්වා දිය හැකි ය.

16. ස්ථූලතාව පාලනය කරගැනීම සඳහා පාරිභෝජනය කළ හැකි ආහාර වේලකි.

1. තම්බපු නිවුඩු සහලේ බත්, කඩල ව්‍යංජනය, අල සුදට සහ කැරට් සලාදය.
2. සුදු බත්, මාලු කිරට, අල බැදුම සහ ගොටුකොළ සම්බලය.
3. කැකුළු බත්, මාලු ඇඹුල්තියල්, අල සුදට සහ බටු මෝජුව.
4. කැකුළු නිවුඩු සහලේ බත්, පරිප්පු ව්‍යංජනය, වට්ටක්කා කරිය සහ බීට් සලාදය.
5. තම්බපු නිවුඩු සහලේ බත්, මාලු මිරිසට, කරවිල ව්‍යංජනය සහ ගොටුකොළ සම්බලය.

17. පුද්ගලයෙකු විසින් පෙන්වන ලද රෝග ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A- කතා කිරීමේදී ගොත ගැසීම හා ඔහුගේ කට ඇද වී තිබීම,
B- අධික හිසරදය
C- අතක් එසවීමට අපහසු බව
D- අධික පිපාසය දැනීම
E- පපුවේ දැවිල්ල

ඉහත ලක්ෂණ අතුරින් ආඝාතයෙහි රෝග ලක්ෂණ වනුයේ,

1. A,B, සහ C ය. 2. A ,B, සහ E ය. 3. A ,C සහ D ය. 4. A ,B, සහ D ය. 5. C,D, සහ E ය.

18. ගෘහස්ථ ශීතකරණයක එළවළු හා පලතුරු ගබඩා කළ යුතු උෂ්ණත්ව පරාසය වනුයේ,

1. $3^0C - 4^0C$ ය. 2. $4^0C - 7^0C$ ය. 3. $6^0C - 8^0C$ ය. 4. $0^0C - 18^0C$ ය. 5. $8^0C - 10^0C$ ය.

19. නවීකෘත අභ්‍යන්තර පරිසර තත්ත්ව යටතේ ඇසුරුම් කරන ලද ආහාරයකි.

1. පැකට් කළ රටඉඳි 2. ටින් කළ මස් 3. කිරිපිටි පැකට් 4. ඇසුරුම් කළ මාළු 5. කල්කිරි

20. ක්ෂුද්‍රජීවීන්ගේ වර්ධනයට අවශ්‍ය අභ්‍යන්තර සාධක ඇතුළත් කාණ්ඩය කුමක්ද?

1. pH අගය, ආර්ද්‍රතාව සහ ආහාරයේ තෙතමනය.
2. ආර්ද්‍රතාව , වායුගෝලීය $O_2$ සහ රෝපණ මාධ්‍ය.
3. ඔක්සිකරණ විභවය, pH අගය සහ පෝෂ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණය.
4. ගබඩා කරන උෂ්ණත්වය, ආර්ද්‍රතාව සහ pH අගය .
5. වායුගෝලීය $O_2$, උෂ්ණත්වය සහ ආර්ද්‍රතාව.

21. ආහාර නරක් වීමට බලපාන ක්ෂුද්‍ර ජීවීන්ගේ DNA ඇතුළු සෛලීය ව්‍යුහය විනාශ කිරීමේ හැකියාව ඇති පරිරක්ෂණ ක්‍රමයක් වනුයේ ,

1. පැස්ටරීකරණය.
2. දුම් ගැසීම.
3 . ශීත වියලනය.
4. ප්‍රවිකිරණය කිරීම.
5. යාන්ත්‍රික වියළීම.

22. සලාද වර්ග පිළියෙල කිරීම පිළිබඳ වඩාත් **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

1. සලාද වර්ග පිළියෙල කිරීම සඳහා යෝග්‍ය එළවළු වර්ග පමණක් තෝරා ගත යුතු වේ.
2. සලාද වර්ග අනිවාර්යයෙන් ම සිසිල් ව පිළිගැන්වීම කළ යුතු වේ.
3. සලාදයක් සඳහා අමු ද්‍රව්‍ය කිහිපයක් මිශ්‍රකර පිළියෙල කිරීම අත්‍යාවශ්‍ය වේ.
4. සලාදයක් සඳහා අමු ද්‍රව්‍ය මිශ්‍රකිරීමේදී සලාද වැස්මක් භාවිත කළ යුතු වේ.
5 .සලාද අධික ලෙස වර්ණ භාවිතයෙන් තොර ව පිළියෙල කළ යුතු වේ.

23. ඇගලුම් කර්මාන්තයේදී, ඇගලුම් නිෂ්පාදන ක්‍රියාවලියේ පියවර **නිවැරදි** අනුපිළිවෙළ දක්වා ඇති වරණය තෝරන්න.

1. රෙදිවල තත්ත්ව පරීක්ෂාව, කැපීම, මැසීම හා නිමාව ය.
2. කැපීම, මැසීම, රෙදිවල තත්ත්ව පරීක්ෂාව හා නිමාව ය.
3. නිමාව, කැපීම, මැසීම හා ඇසුරුම්කරණය
4. කැපීම, මැසීම. ඇසුරුම්කරණය හා නිමි ඇඳුම් තත්ත්ව පරීක්ෂාව
5. කැපීම, මැසීම, ඇසුරුම්කරණය හා නිමාව ය.

24. A,B,C,හා D රූප සටහන්වලින් දැක්වෙන මැහුම් ක්‍රම වනුයේ **අනුපිළිවෙලින්,**



A

B

C
D

1. බුලියන් මැස්ම , හුරුළුකටු මැස්ම ,කාස්ට්‍රිඕන් මැස්ම , සහ ප්‍රංශගැට මැස්ම වේ.
2. හුරුළුකටු මැස්ම , ප්‍රංශගැට මැස්ම , බුලියන් මැස්ම , සහ කාස්ට්‍රිඕන් මැස්ම වේ.
3. බුලියන් මැස්ම , කාස්ට්‍රිඕන් මැස්ම , හුරුළුකටු මැස්ම ,සහ ප්‍රංශගැට මැස්ම වේ.
4. කාස්ට්‍රිඕන් මැස්ම , බුලියන් මැස්ම , ප්‍රංශගැට මැස්ම සහ හුරුළුකටු මැස්ම වේ.
5 . බුලියන් මැස්ම , කාස්ට්‍රිඕන් මැස්ම , ප්‍රංශගැට මැස්ම සහ හුරුළුකටු මැස්ම වේ.

25. පහත රූප සටහන්වල දක්වා ඇති වියමන් රටා **පිළිවෙලින්** නම් කරන්න.

1. හරස්දාර වියමන සහ සැටින් වියමන ය.
2. හරස්දාර වියමන සහ ජටා වියමන ය.
3. දික්දාර වියමන සහ සැටින් වියමන ය.
4. සැටින් වියමන සහ හරස්දාර වියමන ය.
5. සැටීන් වියමන සහ දික්දාර වියමන ය.




26. ජලරෝධක නිමාව යෙදූ රෙදිවලින් මසන ලද, වැහි කබා වැනි ඇඳුම් ඇඳ සිටීම අපහසු වනුයේ,

1. ඉටි වර්ග අඩංගු වීම නිසාය.
2. අද්‍රාව්‍ය ලෝහමය සංයෝග නිසාය.
3. ලින්සීඩ් තෙල් අඩංගු නිසාය
4. සවිවර බවින් තොරවීම නිසාය.
5. නැනෝ තාක්ෂණය යොදා ඇති නිසාය.

27. ක්ෂුද්‍රජීවී හානිවීම්වලට පහසුවෙන් ලක්වන රෙදි වර්ග ඇතුළත් කාණ්ඩය වන්නේ,

1. කපු, ලිනන් සහ නයිලෝන් ය.
2. විස්කෝස්, නයිලෝන් සහ ඇරමිඩ් ය.
3. සේද, රෙයෝන් සහ පොලිඑස්ටර් ය.
4. කපු, රෙයොන් සහ පොලිඑස්ටර් ය.
5. කපු, සේද සහ විස්කෝස් ය.

28. රෙදිපිළි සැන්ෆරයිස් කිරීමේ ප්‍රධාන අරමුණ **වන්නේ,**

1. සේදීම නිසා රෙද්දේ සිදුවන හැකිලීම අවම කිරීම යි.
2. බැක්ටීරියා හා දිලීර නිසා සිදුවිය හැකි හානිය අවම කිරීම යි.
3. රෙදි මතුපිට ඇති අපද්‍රව්‍ය හා වර්ණක ඉවත් කිරීම යි.
4. රෙදිවල ඇති නැම්මේ හා කඩා හැලීමේ ගුණය වැඩි කිරීම යි.
5. රෙදි මතුපිට සුමුදු සුව පහසු වයනයක් ඇති කිරීම යි.

29. මේස දරණුවක් ක්විල්ට් කිරීමේදී රැළි වැටීම වළක්වා ගැනීමට අනුගමනය කළ හැක්කේ,

1. වටේට ඇති පැඩින් කොටස් කපා ඉවත් කිරීම ය.
2. ගැළපෙන වර්ණයකින් බඳන වාටියක් යෙදීම ය.
3. වටේට ඇති මැහුම් පාර නොකැපෙන සේ කැපුම් අද්දර යෙදීම ය .
4. මධ්‍යයේ සිට පිටතට සිහින් නූල් දුවවීම ය.
5 .පිටත සිට ඇතුළට සිහින් නූල් දුවවීම ය.

30 . කෙටි සාය ඉදිරිපස පතරොම නිර්මාණය කිරීම සඳහා ඉණ මිනුම ගණනය කිරීම, **නිවැරදිව** දක්වා ඇති වරණය වන්නේ.

1. $\frac{\text{ඉණ මිනුම}}{4}$ + 0.25cm + 2cm
2. $\frac{\text{ඉණ මිනුම}}{2}$ + 2cm + 0.25cm
3. $\frac{\text{ඉණ මිනුම}}{4}$ + 2cm + 0.25cm
4. $\frac{\text{ඉණ මිනුම}}{2}$ + 1.5cm + 2cm
5. $\frac{\text{ඉණ මිනුම}}{2}$ + 1.5cm + 2cm

31. සම්මුඛ පරීක්ෂණයක් සඳහා මුහුණ දීමට අසුන් ගන්නා ලද කාන්තාවක විසින් තම අත් බෑගය තබා ගැනීමට වඩාත් සුදුසු වන්නේ,

1. තම උකුල මත ය.
2. අසළ ඇති මේසයක් මත ය.
3. උරහිසෙහි රඳවා ගෙන ය.
4. අසුන්ගත් පුටුවෙහි රඳවා තබා ය.
5. තම අසුන අසළ බිම ය.

32. පුද්ගලයන් අතර අන්තර් පුද්ගල සබඳතා ගොඩනැගීමේ දී ඒ එකිනෙකා තම තමන්ගේ මතවාද ලිහිල් කර යම් තීරණයකට එළඹීම හඳුන්වනුයේ,

1. විශ්වාසනීය බව ලෙස ය.
2. භාෂා හැකියාව ලෙස ය.
3. අන්තර්ගතය ලෙස ය.
4. සංකාසනය ලෙස ය.
5 .සංසන්ධි කථිකාව ලෙස ය.

33. කණ්ඩායමක් ලෙස සංවිධානය වී දඹදිව/ශුද්ධ වූ දේශය / මක්කම වන්දනා කිරීම සඳහා යාම හැඳින්විය හැක්කේ,

1. අභ්‍යන්තර යොමුගත සංචරණය ලෙස ය. 2. ප්‍රයාන සංචරණය ලෙස ය.

3. රාශිගත සංචරණය ලෙස ය. 4. රූ දෙස් සංචරණය ලෙස ය. 5 .සෞඛ්‍ය සංචරණය ලෙස ය.

34. පුද්ගලයෙකුගේ මානසික හා ශාරීරික වශයෙන් ධනාත්මක වෙනසක් ළගා කර ගැනීමට විවේකය ,සතුට, විනෝදය වැනි අත්දැකීම් ලබා ගැනිම හඳුන්වන්නේ,

1. කාල කළමණාකරණය ලෙස ය. 2. ආත්ම අසමානය ලෙස ය. 3. ආත්ම විශ්වාසය වැඩි දියුණු කිරීම ලෙස ය.

4. අධ්‍යාත්මික වර්ධනය ලෙස ය. 5. ප්‍රතිමෝදනය ලෙස ය.

35. දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක් වූ හා විදේශ විනිමය උපයන ශ්‍රී ලංකාවේ අලි ඇතුන් සම්බන්ධ ව ප්‍රසිද්ධියට පත් අභය භූමිය කුමක්ද?

1. කුමන ය. 2 යාල ය. 3. පින්නවල ය. 4. මින්නේරිය ය. 5. විල්පත්තු ය.

36. රට තුළට පැමිණෙන අනේවාසික ආගන්තුකයින්ගේ සංචරණය හඳුන්වන්නේ,

1. ජාතික සංචරණය ලෙස ය. 2. බාහිර යොමුගත සංචරණය ලෙස ය.

3. කලාප අභ්‍යන්තර සංචරණය ලෙස ය. 4. කලාපාන්තර සංචරණය ලෙස ය.

5. අභ්‍යන්තර යොමුගත සංචාරණය ලෙස ය.

37. සැපයුම් අධිකාරියට පමණක් අයත් වන ගෘහ විදුලි සැපයුම් පද්ධතියේ ඇති උපාංග **වන්නේ,**

1. අධිධාරා පරිපථ බිඳිනය සහ වොට්පැය මීටර ය. 2. ප්‍රධාන වෙන්කරණය සහ සිගිති පරිපථ බිඳින ය.

3. ශේෂ ධාරා පරිපථ බිඳිනය සහ ප්‍රධාන වෙන්කරණ ය. 4. පහන් කෙවනි පරිපථ සහ ශේෂධාරා පරිපථ බිඳින ය.

5. සිගිති පරිපථ බිඳිනය සහ පහන් කෙවනි පරිපථ ය.

38. විදුලි පේනුවලට රැහැන් සම්බන්ධ කිරීමේදී උදාසීන හා භූගත රැහැන්වල වර්ණ **අනුපිළිවෙලින්** දැක්වෙන පිළිතුර වන්නේ,

1. කොළ සහ දුඹුරු ය. 2. රතු සහ කොළ ය. 3. කොළ සහ නිල් ය. 4. නිල් සහ කොළය ය 5. දුඹුරු සහ කොළ ය.

39. විද්‍යුත් ශක්තිය, යාන්ත්‍රික ශක්තිය බවට පත්කර එය චාලක ශක්තිය ලෙස ප්‍රයෝජනයට ගැනෙන උපකරණ ඇතුලත් කාණ්ඩය වනුයේ,

1. ඉස්ත්‍රික්කය, රෙදිසෝදන යන්ත්‍රය සහ බ්ලෙන්ඩර ය.

2. බ්ලෙන්ඩරය , රයිස් කුකරය සහ විදුලි පෝරණුව ය.

3. විදුලි උදුන, රෙදිසෝදන යන්ත්‍රය සහ ඉස්ත්‍රික්කය ය.

4. රෙදි සෝදන යන්ත්‍රය , විදුලි පෝරණුව සහ රයිස් කුකර ය.

5. රෙදි සෝදන යන්ත්‍රය, වතුර මෝටරය සහ බ්ලෙන්ඩර ය.

40. ජාතික ජල සම්පාදන මණ්ඩලයෙන් ජල බිල් පතක් ගණනය කිරීමේදී ,ජල ඒකකයක් ලෙස දක්වනුයේ,

1. ජලය ඝන ලීටර් ඒකක ප්‍රමාණය කි. 2. ජලය ඝන ලීටර් දෙක කි.

3. ජලය ඝන මීටර් ඒකක ප්‍රමාණය කි. 4. ජලය ඝන මීටර් දෙක කි. 5. ජලය ලීටර් දස දහස කි.

41. මුළුතැන්ගෙයින් පිටවන අප ජලයේ වැඩි වශයෙන් අන්තර්ගත අපද්‍රව්‍ය **වන්නේ,**

1. තෙල් සහ මේදය වේ. 2. බැක්ටීරියා වේ. 3. ලවණ වේ.

4. සේදුම්කාරක වේ. 5. විෂ රසායන සංයෝග වේ.

42. දේශගුණික සාධකයක් වන උෂ්ණත්වය වෙනස්වීම නිසා ඇති වන බලපෑමක් **නොවන්නේ,**

1. පානීය ජල අර්බුද ය. 2. පීවීන් වඳ වී යාම ය.

3. අස්වනු අඩු වීම ය. 4. ආහාර හිඟ වීම ය. 5. පාංශු ඛාදන ය.

43. ගෘහස්ථ පිළිස්සීමක් සිදු වූ අවස්ථාවකදී භාවිත කරන ඖෂධීය ශාකයක් **වන්නේ,**

1. උදුපියලි ය. 2. කොහොඹ ය. 3. කෝමාරිකා ය.
4. කහ ය. 5. ගම්මාලු ය.

44. හරිතාගාර වායු විමෝචනය වැඩියෙන්ම සිදු වන්නේ,

1. පොසිල ඉන්ධන භාවිතයෙනි. 2. දෙමුහුන් වාහන භාවිතයෙනි .
3. සූර්ය ශක්තිය භාවිතයෙනි. 4. L.P ගෑස් භාවිතයෙනි . 5. ජීව වායුව භාවිතයෙනි.

45. නව යොවුන් අවධියේ සංවර්ධනය පිළිබඳ **<u>අසත්‍ය</u>** ප්‍රකාශය කුමක්ද?

1. කායික වර්ධනය වේගයෙන් සිදුවේ. 2. බුද්ධි වර්ධනය වේගයෙන් සිදුවේ.
3. චිත්තවේගිය වර්ධනය වේගයෙන් සිදුවේ. 4. ලිංගික වශයෙන් පරිණත වීම සිදුවේ. .
5. ස්ව සංකල්පය ගොඩනගා ගැනීමට යොමු වේ.

46. යොවුන් වියේ දරුවෙකුගේ පෞරුෂය කෙරෙහි බලපාන ප්‍රබල බාහිර සාධකයක් **වන්නේ,**

1. පවුල ය. 2. හමේ වර්ණ ය 3. සමාජය ය.
4. විශේෂ හැකියා ය. 5. සමහර රෝග ය.

47. යොවුන් වියේ සංවර්ධනය පිළිබඳ ශිෂ්‍යාවක් විසින් පහත සඳහන් අදහස් දක්වන ලදී.

A - තම ස්වකීය දර්ශනය ගොඩනගා ගැනීම ආරම්භ කරයි .

B- සිරුරෙහි ලිංගික විපර්යාසයන් සිදුවීම සඳහා ආහාර පරිභෝජනය කරන ආකාරය බලපායි.

C - සබකෝලය, ප්‍රීතිය, ආදරය හා කෝපය යන චිත්තවේග කැපීපෙනෙන ලෙස පෙන්නුම් කරයි.

D- සමවයස් ඇසුරට හා මිත්‍රශීලීව කටයුතු කිරීමට ,පෙළඹේ.

E- තර්ක විතර්ක ඉදිරිපත් කිරීමට මැලිකමක් දක්වන්නේ තමන්ගේ ස්වරූපය අන් අයට දැනෙන නිසාවෙනි.

මින් යෞවන අවධියට සුවිශේෂී ලක්ෂණ වනුයේ ,

1. A, B, C සහ E ය . 2. B, C, D සහ E ය . 3. A, C සහ D ය .
4. C, D, සහ E ය . 5 . ඉහත සියල්ලම ය.

48. යෞවන අවධියේදී වේගයෙන් කායික වර්ධනය, ලිංගික පරිවර්තනය හා බුද්ධි වර්ධනය සිදුවේ. නමුත් ඒ සමගම ඇති විය හැකි තත්ත්වයක් **වන්නේ,**

1. වෙහෙසකර බවක් ඇති වීමයි. 2. චිත්තවේග අසමතුලිතභාවයයි.
3. සමාජ ආර්ථික පීඩනයයි. 4. බුද්ධි සංවර්ධනය දුර්වල වීමයි.
5. හීනික තත්ත්වය ඇති වීමයි.

49. 'ශදු අත' විශ්ලේෂණයට අනුව (SWOT ANALYSIS) ආහාර නිෂ්පාදන කර්මාන්තයට ඇති තර්ජනයක් සඳහන් වරණය තෝරන්න.

1. පාරිභෝගික රුචිය 2. ප්‍රාග්ධනය 3. ප්‍රවාහන පහසුව
4. රජයේ රෙගුලාසි 5. නොදැනුවත්කම

50. කුඩා පරිමාණ ආහාර නිෂ්පාදන ආයතනයක් 1400ක් වටිනා යෙදවුම් භාවිත කර 1800 වටිනා නිමැවුම් ලබා ගත්තේ නම් එම ආයතනයේ ඵලදායිතාව,

1. 10% කි. 2. 1.2% කි. 3. 12% කි. 4. 15% කි. 5. 20% කි.